සමාජය තුළ කෙතරම් ප්‍රබල බලපෑමක්, කම්පනයක් ඇති කරන වරදක් හෝ අපරාධයක් වුවත් වාර්තා කිරීමේදී තම මධ්‍යස්ථභාවය සහ සමබරතාවය පවත්වා ගැනීම ආචාරධාර්මික මාධ්‍යකරණයේ අත්‍යවශ්‍ය කරුණකි. කෙසේ නමුත් මෙම කොන්දේසිය බිඳවැටෙන අවස්ථාවක් ද අපට නිරීක්ෂණය කළ හැක.

උදාහරණයක් ලෙසින් පහත ප්‍රවෘත්තිය ගනිමු. සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ද බොහෝ කතාබහට ලක්වූ මෙම ප්‍රවෘත්තිය අරුණ පුවත්පත ඔස්සේ වාර්තා කරන්නේ, සිරස්තලයන් තුළ අදාළ සැකකරුව "නරුම ගුරා" වැනි යෙදුම් ඔස්සේ හඳුන්වමිනි.

අප විසින් මින් පෙරද සංවාදයට බඳුන් කොට ඇත්තේ ශිෂ්ට සම්පන්න චින්තනයක් නිර්මාණය වීම සඳහා ශිෂ්ට සම්පන්න භාෂා භාවිතයක ඇති වැදගත්කමයි. ඒ අනුව යම් යම් වෘත්තීන්හි නියැළෙන්නවුන් හැඳින්වීම සඳහා මෙවන් ඍණාත්මක නාමකරණයන් භාවිතා කිරීම ගැටළුකාරී නොවන්නේද?

ඊට අමතරව, නීතිය ඉදිරියේ තවමත් සැකකරුවකු වන අයකු මෙසේ වරදකරුවකු බව මාධ්‍ය මගින් පූර්ව විනිශ්චයකට ලක් කිරීම යුක්තියුක්තද?
මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaPress #News #Aruna**